*සැ. යු.* - (i) 2014.02.28 වැනි දින පළවූ අංක 1852 දරන *ගැසට් පත්‍රයේ* II සහ IV(අ) කොටස් පළ නොවීය.
(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටස යටතේ 2014 වර්ෂය සඳහා නුවරඑළිය අධිකරණ කලාපයට අයත් ජූරි සභිකයින්ගේ නාමලේඛනයක් සිංහල. දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,853 - 2014 මාර්තු මස 07 වැනි සිකුරාදා - 2014.03.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 178 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 178 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 මාර්තු මස 28 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 මාර්තු මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

# රජයේ නිවේදන

**මහ/සෙංකඩගල අඳ බිහිරි විදුහල**

ගරු සාමාන්‍යාධිකාරි තනතුරට පත්කිරීම

පිළිමතලාව පරකටවැල්ල 211/ඒ හි පදිංචි හීන්කෙන්ද මුදියන්සේලාගේ ධර්මරත්න බණ්ඩා මහතා, මහනුවර දොඩම්වල අඳ බිහිරි පාසලේ 2013 නොවැම්බර් මස 10 වැනි දින පැවති සීමාසහිත සෙංකඩගල අඳ බිහිරි පාසල් සමිතියේ වාර්ෂික මහ සභා රැස්වීමේ දී ගරු සාමාන්‍යාධිකාරි තනතුරට නිත්‍යානුකූලව තෝරාගනු ලැබීමෙන් පසුව 2014 ජනවාරි මස 01 වැනි දින සිට සෙංකඩගල අඳ බිහිරි පාසලේ ගරු සාමාන්‍යාධිකාරි තනතුරට පත් කරනු ලැබූ බව ශ්‍රී ලංකා ජනරජයේ සහ මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ශ්‍රියා අත්තනගොඩ,
ගරු ලේකම්,
සීමාසහිත සෙංකඩගල අඳ බිහිරි පාසල් සමිතිය.

එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න,
දිසාපති/දිස්ත්‍රික් ලේකම් (මහනුවර),
සභාපති,
සීමාසහිත සෙංකඩගල අඳ බිහිරි පාසල් සමිතිය.

03-10

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**සෙලාන් බැංකුව පීඑල්සී - කොළඹ කොටුව ශාඛාව**

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව
යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

ගිණුම් අංකය : 0300 - 072254 -001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013.12.03 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එන්. රාජකරුණා විසින් සහතික කරන ලද 2000 අප්‍රේල් 20 දිනැති අංක 184, ප්‍රසිද්ධ නොතාරිස් බී. ඒ. ආර්. අමරසේන විසින් සහතික කරන ලද 2005 ජූලි 20 දිනැති අංක 153 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, රත්මලාන සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ව්‍යාපාර ලියාපදිංචි අංක එන් පීවී 2326 දරන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන (කලින් ලියාපදිංචි අංක එන් (පීවීඑස්) 12606 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ) ධි මාස්ටර්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දෙකෝටි විසිතුන් ලක්ෂ පනස් තුන් දහස් හාරසිය තිස් දෙකයි ශත හතලිස් නවයක (රු.2,23,53,432.49) මුදලක්, 2013 ජුනි 30 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු.2,23,53,432.49 මුදලද, 2013 ජුලි මස 1 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් එක (31%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී බැඳුම්කර අංක 184 සහ 153 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

*අයිතම 1.*-බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ තෙලවල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. අඹලවානර් විසින් සාදන ලද 1956 ජූලි 15 දිනැති අංක III දරන සැලැස්මේ නිරූපනය වන තිස්ස මාවත වරිපනම් අංක 16 දරන, ලේඩි කැතරින් ග්‍රෑප් නමැති, එහි පිහිටි ගොඩනැගිල්ල සමග ඉඩමේ ලොට් 75 ලකුණු කල, බෙදා වෙන් කරන ලද සම්පූර්ණ ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී අංක III දරන සැලැස්මේ ලොට් 69 බී ද, නැගෙනහිරට : එකී අංක III දරන සැලැස්මේ ලොට් 74 (පාර සඳහා වෙන් කිරීම) ද, දකුණට : එකී අංක III දරන සැලැස්මේ ලොට් 89 සහ බස්නාහිරට : එකී අංක III දරන සැලැස්මේ ලොට් 76 ද යන මායිම් තුළ එකී අංක III දරන සැලැස්ම අනුව පර්චස් විසි දෙකයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 22.5) ක් විශාල, ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 2460/167 යටතේ ලියාපදිංචි කර ඇත.

*අයිතම 2.*-බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ තෙලවල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. අඹලවානර් විසින් සාදන ලද 1956 ජුනි 15 දිනැති අංක III දරන සැලැස්මේ නිරූපනය වන තිස්ස මාවත වරිපනම් අංක 16 දරන, ලේඩි කැතරින් ග්‍රෑප් නමැති, එහි පිහිටි ගොඩනැගිල්ල සමග ඉඩමේ ලොට් 69බී ලකුණු කළ, බෙදා වෙන් කරන ලද සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් උතුරට : එකී අංක III දරන සැලැස්මේ ලොට් 69ඒ ද, නැගෙනහිරට : එකී අංක III දරන සැලැස්මේ ලොට් 74 (පාර සඳහා වෙන් කිරීම) ද, දකුණටඃ

එකී අංක III දරන සැලැස්මේ ලොට් 75 සහ බස්නාහිරට : එකී අංක III දරන සැලැස්මේ ලොට් 68 ද යන මායිම් තුළ එකී අංක III දරන සැලැස්ම අනුව පර්චස් විස්සක් (අ. 0, රූ, 0, පර්. 20) ක් විශාල, ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 2460/168 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් මාර්ගය තුළ, උඩින් සහ යටින් මාර්ග අයිතිය සමග

පෙර කී තෙලවල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. අඹලවානර් විසින් සාදන ලද 1956 ජුනි 15 දිනැති අංක III දරන සැලැස්මේ නිරූපනය වන ලේඩි කැතරින් ග්‍රූප් නමැති ඉඩමේ ලොට් 74 (පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ, බෙදා වෙන් කරන ලද සම්පූර්ණ ඉඩම් කොටසට මායිම්, උතුරට : බොරුපන පාලම් පාරුව පාර ද, නැගෙනහිරට : එකී අංක III දරන සැලැස්මේ ලොට්ස්, 52, 55, 70,73, 90, 93, 110, 113, 128, 131, සහ 149 ද, දකුණට : එස්ටේට් පාර සහ බස්නාහිරට : එකී අංක III දරන සැලැස්මේ ලොට්ස් 51, 56, 69ඒ, 69බී, 75, 89, 94ඒ, 94බී, 109ඒ, 109බී, 114ඒ, 114බී, 127ඒ, 127බී, 132ඒ, 132බී, 147 සහ 148 ද යන මායිම් තුළ එකී අංක III දරන සැලැස්ම අනුව රූඩ් දෙකයි පර්චස් තිස් අටක් (අ. 0, රූ, 2, පර්. 38) ක් විශාල, ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 2686/142 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැච් මෙය,
සහකාර සාමාන්‍යාධිකාරිනී - නීති.

03-104

---

## මහජන බැංකුව - මතුගම සහ ආයතනික ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013 නොවැම්බර් මස 26 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් පී. ආර්. කේ. එන්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද 2011.09.08 දිනැති අංක 5216 දරන උකස්කරය සහ අංක 6197 හා 2012.03.22 දිනැති උකස්කරය මත සේලා කිං තර්මල් සිස්ටම්ස් (පුද්ගලික) සමාගම යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී අංක 5216 දරන උකස්කරය යටතේ රුපියල් මිලියන තුනකුත් අටසිය තිස්තුන් දහස් තුන්සිය තිස් තුනක (රු.3,833,333) මුදලක් ද එකී අංක 6197 දරන උකස්කරය යටතේ දැනට රුපියල් මිලියනයකුත් හාරසිය අසූහතර දහස් හැටතුනයි ශත පනහක් (රු.1,484,063.50) සහ රුපියල් මිලියනයකුත් තුන්සිය හැත්තෑතුන් දහස් හත්සියයක (රු.1,373,700) මුදලක් ද මහජන බැංකුවට අය වීමට ඇති බැවින් ද 2013.07.02 දින සිට වර්ෂයකට 15% බැගින් රුපියල් මිලියන තුනකුත් අටසිය තිස්තුන් දහස් තුන්සිය තිස් තුනන් (රු. 3,833,333) ක මුදල සඳහා ද 2013.02.02 දින සිට වර්ෂයකට 19% බැගින් රුපියල් මිලියනකුත් හාරසිය අසූහතර දහස් හැටතුනයි ශත පනහක (රු.1,484,063.50) මුදල සඳහා ද 2013.07.02 දින සිට වර්ෂයකට 19% බැගින් රුපියල් මිලියනයකුත් තුන්සිය හැත්තෑතුන් දහස් හත්සියයක (රු. 1,373,700) මුදල සඳහා ද වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය සහ අදාළ මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අය කර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී මුදල් සඳහා අයකර ගැනීමට කොළඹ බලයලත් වෙන්දේසිකාර එස්. රාමනායක මහතා විසින් එකී අංක 5216 සහ 6197 උකස්කර යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උපලේඛනය

කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ජී 268/280 දරන පත්‍ඉරුවේ ලියාපදිංචි කර ඇති බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුණේ කළුතර බැද්දේ වේලාපුර කළුතර යන ගම පිහිටා ඇති ගොරකගහවත්ත, අළුත්ගේවත්ත සහ අත්තාවත්ත නමැති ඉඩමේ කැබලි අංක බී 1 ට අවසරලත් මානක ඩී. කේ. ටී. බැද්දවිතාන විසින් වර්ෂ 2008.12.21 වැනි දින මැන සකස් කරන ලද අංක 433 ඒ දරන පිඹුරේ සඳහන් කැබලි අංක බී 1 දරන ඉඩමට මායිම්, උතුරට : අංක 2953 දරන පිඹුරේ කැබලි අංක වයි සහ ඉසෙඩ් (දැනට පාර) ද, නැගෙනහිරට : කැබලි අංක බී 2, දකුණට : එළදර්වත්ත සහ අංක 2308 දරන පිඹුරේ කැබලි අංක 2 සී ද, බස්නාහිරට : අංක 2308 දරන පිඹුරේ කැබලි අංක 2 සී සහ අංක 428 ඒ පිඹුරේ කැබලි අංක ඒ ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහ අටයි දශම නවයයි බිංදුව (අ. 0, රූ.0, පර්. 18.90) විශාල ඉඩම සහ එය තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ඇතුළු සියලු දෙය වේ.

කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ජී 268/281 දරන පත් ඉරුවේ ලියාපදිංචි කර ඇති බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණ, කළුතර බද්දේ වේලාපුර යන ගම පිහිටා ඇති ගොරකගහවත්ත, අළුත්ගේ වත්ත සහ අත්තාවත්තේ කැබලි අංක බී 2 දරන ඉඩමට අවසරලත් මානක ඩී. කේ. ටී. බැද්දවිතාන විසින් වර්ෂ 2008.12.21 වැනි දින මැන සකස් කරන ලද අංක 433 ඒ දරන පිඹුරේ සඳහන් කැබලි අංක බී 2 දරන ඉඩමට මායිම්, උතුරට : අංක 2953 දරන පිඹුරේ කැබලි අංක ඉසෙඩ් ද, (දැනට පාර) නැගෙනහිරට : අංක 428 ඒ දරන පිඹුරේ කැබලි අංක සී ද, දකුණ : ගාල්ල ගෙවත්ත සහ එළදර්වත්ත ද, බස්නාහිරට : කැබලි අංක බී 1 ද යන මායිම් තුල පිහිටි පර්චස් දාසයයි දශම හතරයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 16.40) විශාල ඉඩම සහ එය තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ඇතුළු සියලු දෙය වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමණාකරු (කළුතර),

මහජන බැංකුව,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (කළුතර),
අංක 341, ගාළු පාර,
පානදුර.

03-186

---

## සෙලාන් බැංකුව පීඑල්සී - හැව්ලොක් ටවුන් ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව
යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

ගිණුම් අංකය : 0830-368999-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013.11.25 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය

කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් චන්ද්‍රාගී සිවදාසන් විසින් සහතික කරන ලද 2009 ජූලි 9 දිනැති අංක 737 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, කොළඹ 07 පදිංචි ජයවීර ආරච්චිගේ දසරත් ලූෂන් පෙරේරා යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක් කෝටි හතලිස් පන්ලක්ෂ අසූ දහස් හයසිය තිහයි ශත අසූතුනක (රු.14,580,630.83) මුදලක්, 2013 අප්‍රේල් 8 වෙනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද එකී රු. 14,580,630.83 මුදලද, 2013 අප්‍රේල් 9 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් එක (31%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර ගැනීම පිණිස ඉහතකී අංක 737 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තා වූ මෙහි සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සභාව තුළ තිඹිරිගස්යාය වෝඩ් අංක 40 තිඹිරිගස්යාය ටොරිංටන් ඇවනියු දිගේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. පී. විජේවීර විසින් සාදන ලද 2002 නොවැම්බර් 12 දිනැති අංක 2074 දරන සැලැස්මේ නිරූපනය වන ටොරිංටන් ඇවනියු වරිපනම් අංක 290/2 දරන ලොට් එෆ් ලකුණු කළ නිවස සමග බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, ඊසානට : මෙහි සඳහන් ලොට් පී ද, ගිණිකොණට : බලයලත් මිනින්දෝරු පී. චන්ද්‍රසේන විසින් සාදන ලද 1993 දෙසැම්බර් 20 දිනැති අංක 108/93 සැලැස්මේ සඳහන් ලොට්ස් ඩී සහ සී ද, නිරිතට : පුද්ගලික පාර සහ වයඹට : මෙහි සඳහන් ලොට් ඊ ද යන මායිම් තුළ එකී අංක 2074 දරන සැලැස්ම අනුව පර්චස් නවයයි දශම එකයි දෙකක් (අ. 0, රූ. 0, පර්චස් 9.12) නොහොත් හෙක්ටයාර් 0.0231 විශාල, ඉඩම මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1082/151 හි ලියාපදිංචි කර ඇත.

2. පෙරකී තිඹිරිගස්යාය වෝඩ් අංක 40 තිඹිරිගස්යාය ටොරිංටන් ඇවනියු දිගේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. පී. විජේවීර විසින් සාදන ලද 2002 නොවැම්බර් මස 12 දිනැති එකී අංක 2074 දරන සැලැස්මේ නිරූපනය වන ලොට් ඒ (පාර සඳහා වෙන් කිරීමක් වන) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, ඊසානට : ටොරිංටන් ඇවනියු ද, ගිණිකොණට : ටොරිංටන් ඇවනියු වරිපනම් අංක 296, 296/1, 296/3 සහ 298 පරිශ්‍රයන් ද, නිරිතට : මෙහි සඳහන් ලොට් ඊ සහ වයඹට : බලයලත් මිනින්දෝරු පී. චන්ද්‍රසේන විසින් සාදන ලද 2002 මාර්තු 26 දිනැති අංක 2002/210 සැලැස්මේ සඳහන් ලොට් ඒ 2 ද යන මායිම් තුළ එකී අංක 2074 දරන සැලැස්ම අනුව පර්චස් හතරයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්චස්. 4.50) නොහොත් හෙක්ටයාර 0.0114 විශාල, ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1082/152 හි ලියාපදිංචි කර ඇත.

3. පෙරකී තිඹිරිගස්යාය වෝඩ් අංක 40 තිඹිරිගස්යාය ටොරිංටන් ඇවනියු දිගේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. පී. විජේවීර විසින් සාදන ලද 2002 නොවැම්බර් 12 දිනැති එකී අංක 2074 දරන සැලැස්මේ නිරූපනය වන ලොට් ඊ (පාර සඳහා වෙන් කිරීමක් වන) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, ඊසානට : මෙහි සඳහන් ලොට් ඒ ද, ගිණිකොණට : මෙහි සඳහන් ලොට්ස් එෆ් සහ ජී සහ ටොරිංටන් ඇවනිවු වරිපනම් අංක 296, 296/1, 296/3 සහ 298 දරන පරිශ්‍රයන් ද, නිරිතට : පුද්ගලික පාර සහ වයඹට : මෙහි සඳහන් ලොට්ස් බී, සී සහ ඩී ද යන මායිම් තුළ එකී අංක 2074 දරන සැලැස්ම අනුව පර්චස් හයයි දශම දෙකයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 6.22) නොහොත් හෙක්ටයාර 0.0157 විශාල, ඉඩම මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1082/153 හි ලියාපදිංචි කර ඇත.

4. පයින් ගමන්කිරීමට සහ වාහන ගමනාගමනයට මාර්ග අයිතිය සමග සහ වෙනත් භාවිතාකරන්නන් හට මාර්ගය තුළ උඩින්, දිගේ සහ යටින් විදුලි කේබල්, දුර කථන රැහැන්, උඩු රැහැන්, ප්‍රධාන ජලනල, ජලාපවහන නල, අපද්‍රව්‍ය නල යෙදීමේ අයිතිය සමග.

බස්නාහිර පළාතේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරිගේ කොට්ඨාසයේ, සල්පිටි කෝරළේ කොළඹ මහ නගර සභා සීමාව තුළ තිඹිරිගස්යාය වෝඩ් අංක 40 තිඹිරිගස්යාය පාර පිහිටි බලයලත් මිනින්දෝරු රංජිත් කරුණාරත්න විසින් සාදන ලද 1976 අගෝස්තු 4 දිනැති අංක 346 දරන සැලැස්මේ නිරූපනය වන දෙල්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 6 (අඩි 20 ක් පළළ පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එම්. ඩී. ඊ. ගුණතිලක සහ තවත් අයගේ දේපළ සහ ලොට් 1 ද, නැගෙනහිරට : ලොට් 1 සහ තිඹිරිගස්යාය පාර ද, දකුණට : තිඹිරිගස්යාය පාර වරිපනම් අංක 283 පරිශ්‍රය සහ ලොට් 2, 3 සහ 4 සහ බස්නාහිරට : ලොට් 2 සහ 5 ද යන මායිම් තුළ එකී අංක 346 දරන සැලැස්ම අනුව පර්චස් විසිතුනයි දශම හතරයි හතක් (අ. 0, රූ. 0, පර්චස් 23.47) ක් විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1031/234 හි ලියාපදිංචි කළ ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැච්. මෙය,
සහකාර සාමාන්‍යධිකාරිනී - නීති.

03-103/1

---

**සෙලාන් බැංකුව පීඑල්සී - කාත්තන්කුඩි ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව
යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

ගිණුම් අංකය : 0740-07955680-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014.01.02 පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක : පීකිව් 9 යටතේ ලියාපදිංචි කර

ඇත) ප්‍රසිද්ධ නොතාරිස් නිරෝෂිනී වේලුපිල්ලෙයි විසින් සියල්ලම සහතික කරන ලද 2005 දෙසැම්බර් 23 දිනැති අංක : 451, 2007 සැප්තැම්බර් 20 දිනැති අංක : 555, 2006 සැප්තැම්බර් 13 දිනැති අංක : 512 සහ 2007 සැප්තැම්බර් 20 දිනැති අංක : 556 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, මඩකලපුව, පුන්කුන්දුම් අරයාම්පති හි ව්‍යාපාර ලියාපදිංචි අංක : ආර්ඊ/ආර්බීඑන්/01/බී1 දරන මෙසස් ලතා කන්ස්ට්‍රක්ෂන් යන නාමය විලාශය සහ අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන සෝමසුන්දරම් මහාලිංගම් සහ යෝගේෂ්වරී මහාලිංගම් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් අසූඅට ලක්ෂ හැට දහස් එකසිය හතලිස් හයක මුදලක් (රු.8,860,146.00) මුදලක් 2013 මාර්තු 26 වෙනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 8,860,146 මුදලද, 2013 මාර්තු 27 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් එක (31%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස එකී අංකඃ 451, 555, 512 සහ 556 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි සඳහන් පළමුවන සහ දෙවෙනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රයන් බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමු උපලේඛනය

නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනෙයි පත්තුවේ අරප්පත්තෙයි ගමේ අරප්පත්තෙයි පිහිටි ප්‍රමාණයෙන් උතුරේ සිට දකුණට බඹ හයහමාරක් (6 1/2), නැගෙනහිර සිට බස්නාහිරට උතුරු පැත්තෙන් බඹ අටහමාරක් (8 1/2) ක් දකුණු පැත්තට බඹ නවයක් (9) ක් ද වන නැගෙනහිර පැත්තට පිහිටි බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : වේලායුදම් සහ කතිරම්මෙයි ගේ වත්ත දැන් කන්දප්පා සින්නපිල්ලෙයි ගේ වත්ත ද, දකුණට : පෙරයිතම්බි සහ තවත් අයට හිමි වත්ත දැන් තම්බිරාසා පුවනේශ්වරී ගේ ඉඩම ද, නැගෙනහිරට : කනපතිආර් ගේ වත්ත දැන් සින්නතුරෙයි නල්ලරෙතිනම් සහ භාර්යාව විසින් දායාදයට දුන් ඉඩම සහ බස්නාහිරට : සම්තම්බි යෝගනාදන් ට අයිති මෙම ඉඩමේ අනිත් කොටස යන මායිම් තුළ සියලු අයිතීන් සමග සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙම ඉඩමේ බටහිර කොටසේ නිරිත පැත්තේ කෙළවර දකුණු වැට දිගේ රියන් තුනක් (03) පළල පටුමගක් ඇත. මෙය මඩකලපුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය : බී 398, පත්‍රිරුව : 66 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී දේපල බලයලත් මිනින්දෝරු ඒ. සිංගරාජා විසින් අඳින ලද 2005.04.04 දිනැති අංක : ඒඑස්/2005/392 දරන සැලැස්ම අනුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනෙයි පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය සභා සීමාව තුළ අරෙයිපට්ටි ගමේ අරයම්පතිහි පිහිටි ප්‍රමාණයෙන් පර්චස් නවයයි දශම තුනයි හතක් (අ. 0, රූ. 0, පර්. 9.37) නොහොත් හෙක්ටයාර 0.0237 ක් විශාල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : කේ. සින්නපිල්ලෙයි ගේ ඉඩම ද, නැගෙනහිරට : එස්. නල්ලරෙත්නම් සහ භාර්යාවට හිමි ඉඩම ද, දකුණට : ටී. පුවනේශ්වරී ගේ ඉඩම සහ බස්නාහිරට : එස්. යෝගනාදන්ගේ ඉඩම සහ පාර යන මායිම් තුළ සියලු අයිතීන් සමග සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

### දෙවන උපලේඛනය

නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනෙයි පත්තුවේ අරෙයිපත්තෙයි පිහිටි ප්‍රමාණයෙන් උතුරට : බඹ දහනවය (19) ක් ද, නැගෙනහිරට : දකුණු පැත්තෙන් බඹ දොලහයි හතරෙන් තුනක් (12 3/4) ද, ගිණිකොණ කෙළවර බස්නාහිර පැත්තට බඹ හතයි හතරෙන් එකක් (7 1/4), මෙහි සිට උතුරු පැත්තට : බඹ පහක් (5) ක් ද, මෙහි සිට බස්නාහිර පැත්තට නිරිත අයින දක්වා බඹ හතක් (7) ක් ද බස්නාහිරට : බඹ හයයි හතරෙන් එකක් (6 1/4) ක් වන වක්කඩ්ඩෙයියාර් වලවු නමැති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස මායිම් උතුරට : පාර ද, නැගෙනහිරට : කාතමුතු සහ තවත් අයගේ ඉඩම දැන් කේ. තෙයිවනායගම් ගේ ඉඩම ද, දකුණට : ලේවනායගම් සහ තවත් අයගේ ඉඩම සහ බස්නාහිරට : පාර ද යන මායිම් තුළ සියලු අයිතීන් සමග සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය මඩකලපුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය : බී 255 පත්‍රිරුව : 62 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී දේපල බලයලත් මිනින්දෝරු : ඒ. සිංගරාජා විසින් අඳින ලද 2006.08.22 දිනැති අංක : ඒඑස්/එම්පී/37 දරන සැලැස්ම අනුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනෙයි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ මඩකලපුව ප්‍රාදේශීය සභා සීමාව තුළ අරෙයම්පති ගමේ පරණ කල්මුණේ පාර පිහිටි සක්කඩ්ඩයාර් වලවු නැමති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : අමරසිංහම් වීථි ද, නැගෙනහිරට : කේ. තෙයිවනායකම් ගේ ඉඩම ද, දකුණට : සෙල්වනායකම් සහ තවත්, අයගේ ඉඩම සහ බස්නාහිරට : පරණ කල්මුනේ පාර ද යන මායිම් තුළ පර්චස් දහඅටයි දශම නවයයි හතරක් (අ. 0, රූ. 0, පර්. 18.94) නොහොත් හෙක්ටයාර 0.0479 ක් විශාල, සියලු අයිතීන් සහ එහි තුළ පිහිටි සියලු දේ සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැව් මෙය,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

03-103/4

---

### සෙලාන් බැංකුව පීඑල්සී - යාපනය ශාඛාව

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව
යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013.10.23 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0850-33323848-001

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් වී.ටී. සිවලිංගම් විසින් සහතික කරන ලද 2011 අගෝස්තු 11 දිනැති අංක 1834 දරන බැඳුම්කරය මත අයවිය යුතු

මුදල් ගෙවීම, සියල්ලෝම චාවාකච්චේරි හි පදිංචි කනපතිපිල්ලේ පුලේන්ද්‍රන්, පුලේන්ද්‍රන් නිර්මලරානි මෙය සහ පුලේන්ද්‍රන් කෝකුලරාජන් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්කෝටි හැත්තෑතුන් ලක්ෂ අසූඑක් දහස් පන්සිය එකයි ශත හතළිස් හතක (රු.17,381,501.47) මුදලක් 2013 ජූලි 9 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 17,381,501.47 මුදලද, 2013 ජූලි 10 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට දහ හතක (17%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස එකී අංක 1834 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, තෙන්මරඩ්චි කොට්ඨාසයේ චාවකච්චේරි වසම තුල මිසාලෙයි පිහිටි පන්රිමුඩවන්පුලම් පන්රිමුඩවන්පුලම් වලවුම් කරුවෙම්පන්වලවු නමැති ප්‍රමාණයෙන් 5 1/2 එල්එම්.එස්.වී.සී (ඔප්පු අංක : 22081) 12 එල්එම්එස්. වී. සී. සහ 12 කේඑල්එස් (ඔප්පු අංක : 4062), 81/2 එල්එම්එස් වී. සී. (ඔප්පු අංක : 4063) සහ 87 එල්එම්එස්. වී. සී. (ඔප්පු අංක 7665) එකතුව 113 එල්එම්එස් වී. සී සහ 12 කේඑල්එස් වන සම්පූර්ණ ඉඩම් කොටස මේ සියල්ල බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු කේ. පන්චත්චරම් විසින් අඳින ලද 2011.06.04 දිනැති අංක : 1531 දරන මිනුම් සැලැස්ම අනුව ප්‍රමාණයෙන් 106 එල්එම්එස් වී. සී. සහ 16.09 කේඑල්එස් සමන්විත ලොට් 1 ලකුණු කළ එක් කොටසක් ලෙස සකස්ව ඇති අතර එයට මායිම්, නැගෙනහිරට : පාර ද, උතුරට : අරුල්මොලිද්දේවන් තෙවරත්නම්ගේ දේපල ද, බස්නාහිරට : ගම මායිම්වූ පටුමග ඇති දේපල සහ ගනේශලිංගම් සයන්තන්ගේ දේපල සහ දකුණට : පේදුරුතුඩුව පාර යන මායිම් තුල ළිඳ, එහි තුල පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය යාපනය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/ පත්ඉරුව එෆ් 821/61 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැච්. මෙය,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

03-103/2

---

## සෙලාන් බැංකුව පීඑල්සී - බොරැල්ල ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව
යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014.01.02 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0820-627322-001

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එස්. කුගදරන් විසින් සහතික කරන ලද 2007 අගෝස්තු 31 දිනැති අංක 846 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, රත්මලාන පිහිටි ලියාපදිංචි අංක එන් (පීවීඑස්) 12494 දරන ශ්‍රී ලංකාව තුල යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ලීඩර් පබ්ලිකේශන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියක් එක් කෝටි අසූහයලක්ෂ පනස්තුන්දහස් පන්සිය හැට හතයි ශත විසිහතක (රු.18,653,567.67) මුදලක්, 2013 මාර්තු 14 වෙනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද එකී රු. 18,653,567.27 මුදලද, 2013 මාර්තු 15 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 846 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි සඳහන් උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමු උපලේඛනය

*(අයිතම 1)*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුල රත්මලාන උතුර පිහිටි බලයලත් මිනින්දෝරු ජේ. එම්. ආර්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1953.07.01 දිනැති අංක 418 සැලැස්මේ නිරූපිත වන කලින් මවුන්ට් අත්තිඩිය හෙවත් ටෙම්ප්ලර්ස් එස්ටේට් නමැති රත්මලාන එස්ටේට් නමැති ඉඩමේ දැන් කටුකුරුඳුවත්ත පාර වරිපනම් අංක 43/බී දරන (ඉඩම් මිනින්දෝරු ෆ්‍රෙඩ්රික් බර්තෝලමියුස් විසින් සාදන ලද 1887.12.17 දිනැති සැලැස්මේ සඳහන් ඉඩමේ බෙදන ලද කොටසක් වන) ඉඩමේ ලොට් එෆ් 40 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් එෆ් 39 ලකුණු කළ මෙම ඉඩමේ කොටස ද, නැගෙනහිරට : අත්තිඩියට යන වී. සී. පාර (දැන් කටුකුරුඳුවත්ත පාර නමැති), දකුණට : ලොට් එෆ් 48 ලකුණු කළ ඉඩමේ කොටස සහ බස්නාහිරට : ලොට් එෆ් 41 ලකුණු කළ මෙම ඉඩමේ කොටස ද මායිම් තුල රූඩ් එකයි, පර්චස් දශම එකයි පහක් (අ. 0, රූ. 1, පර්චස් 0.15) විශාල, ඉඩම. මෙය ගල්කිස්ස දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 2888/54 යටතේ ලියාපදිංචි කර ඇත.

*(අයිතම 2)*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ දැන් දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ රත්මලාන උතුර කටුකුරුඳුවත්ත පාර දිගේ පිහිටි බලයලත් මිනින්දෝරු ජේ. එම්. ආර්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1953.07.01 දිනැති අංක 418 සැලැස්මේ නිරූපනය වන රත්මලාන එස්ටේට් නමැති, ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩමේ (ඉඩම් මිනින්දෝරු ෆ්‍රෙඩ්රික් බර්තෝලමියුස්

විසින් සාදන ලද 1887.12.17 දිනැති සැලැස්මේ සඳහන් ඉඩමේ බෙදන ලද කොටසක් වන) ඉඩමේ ලොට් එෆ් 49 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් එෆ් 48 ලකුණු කළ මෙම ඉඩමේ කොටස ද, නැගෙනහිරට : අත්තිඩියට යන වී. සී. පාර (දැන් කටුකුරුඳුවත්ත පාර නමැති), දකුණට : ලොට් එෆ් 64 ලකුණු කළ මෙම ඉඩමේ කොටස සහ බස්නාහිරට : ලොට් එෆ් 50 ලකුණු කළ මෙම ඉඩමේ කොටස ද යන මායිම් තුල රූඩ් එකයි පර්චස් දශම එකයි තුනක් (අ. 0, රූ, 1, පර්චස් 0.13) විශාල, ඉඩම. මෙය ගල්කිස්ස දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 2435/233 යටතේ ලියාපදිංචි කර ඇත.

### දෙවැනි උපලේඛනය

